| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2023-09- 01 |

පැමිණිලි පාර්ශවය :- ජී.වී.ප්‍රියංකා දර්ශනී මිය,
P/09 පොලිස් නිවාස,
අම්පාර.

වින්දිත පාර්ශවය :- ඩී.එම් උශේර තරුෂික

වගඋත්තර පාර්ශවය :- 01.පො.සැ.9945 මංජුල මයා,
02. පො.සැ.63141 චන්දන මයා,
03.පො.කො.67152 විජේවර්ධන මයා,
04. පො.කො.81995 කුමාර මයා,
පොලිස් ස්ථානය, අම්පාර.

පැමිණිලි අංකය :- **HRC/AM/52/20/S/PL**

**පැමිණිල්ලේ සැළකිරීම :-**

පැමිණිලි පාර්ශවය 2020.08.17 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් තම පුතා වන ඩී.එම්.උශේර තරුෂික යන අය 2020.08.14 වන දින මංගල උත්සවයකට සහභාගී වී සිටියදී ඔහුගේ යහළුවකු වන මලිත් මාලක නැමැති අය විසින් ලබා දුන් දුරකථන ඇමතුමකට අනුව එම අයව අම්පාර ඩී.එස්.හන්දියේ සිට බස් නැවතුම්පල දක්වා ඇරලීමට ගිය බවත්, ඒ අනුව අදාළ ස්ථානයට ගොස් එහි සිටි යහළුවන් වන තත්සර දිල්රුක් මානවඩු, මලිත් මාලක හා දිනේෂ් පසන් යන යහළුවන් සමඟ පිටත් වීමට සැරසෙද්දී යතුරු පැදි දෙකකින් පැමිණි පුද්ගලයන් හතර දෙනෙකු එතැන සිටි තම පුතුගේ මුව තුළට පිස්තෝලයක් දමා වෙඩි තබන බවට තර්ජණය කර පහරදී විස්තර විමසා ඇති බවත්, එවිට තම පියවරුන් පොලිස් නිලධාරීන් බව පවසා ඇති අතර, එහිදී "කවුද පොලිස් කාරයින්ගේ ළමයින් ඉන්නේ" යැයි විමසා "අපි ගෙනියන්නේ පොලිස්කාරයන්ගේ ළමයි" බව පවසමින් තත්සර දිල්රුක් මානවඩුට දමා තිබූ මාංචු මලිත් මාලක යන අයට දමා තම පුතු වන උශේර තරුෂික යන අයටද මාංචු දමා ඔවුන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ගංජා ළඟ තබා ගත් බවට නඩු පවරා ඇති බවත් සඳහන් කර ඇත. පසුව 2020.08.15 දින අධිකරණය මඟින් ඇප ලබා ගැනීමෙන් අනතුරුව අම්පාර රෝහලේ රෝහල්ගතව ප්‍රතිකාර ලබා ගත් බවද දක්වා ඇත. සිදුවීමට මුහුනදුන් ඩී.එම්.උශේර තරුෂික ද ප්‍රකාශයක් ලබා දෙමින් ඉහත කරුණුම සනාථ කර ඇති අතර, ඩී.එස්.හන්දියට නුදුරින් පිහිටි අතුරු මාර්ගයේදී මෙම සිදුවීම සිදු වූ බවද පවසා ඇත.




| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office — අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman — 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax — 011- 2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail — sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone — 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary — 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline — 1996 | වෙබ්<br>இணையம்<br>Web — www.hrcsl.lk |

වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-

අම්පාර මූලස්ථාන පොලිස් පරීක්ෂක ඩී.ටී.ලසන්ත මහතා විසින් පැමිණිල්ලට අදාළව වාර්තාවක් ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 218 වන අධිකාරිය වූ විෂ මත්ද්‍රව්‍යා අභිං හා අන්තරාදායක ඖෂධ ආඥා පනත යටතේ බලපත්‍රයක් නොමැතිව කැනබිස් සැටයිවා එල් නොහොත් ගංජා මි.ග්‍රෑ.896 ක් සන්තකයේ තබා ගැනීමේ වරද යටතේ අදාළ පුද්ගලයා 2020.08.14 වන දින පැය 17.00ට අම්පාර විශේෂ කාර්ය බලකා කඳවුර පිටුපස මාර්ගයේ දී පො.සැ.9945 මංජුල, පො.සැ.63141චන්දන, පො.කො. 67152 විජේවර්ධන, හා පො.කො. 81995 කුමාර යන අය විසින් අත්අඩංගුවට ගෙන 2020.08.15 වන දින අම්පාර ම/උ බී.9991/20 යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත.

අදාළ පැමිණිලිකාරියගේ පුතා අත්අඩංගුවට ගත් නිළධාරීන් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ ලබා දෙමින් තමන්ට ස්ථානීය බුද්ධි අංශයේ නිළධාරීන්ගෙන් ලත් තොරතුරක් මත පැමිණිලිකරු හා තවත් පුද්ගලයෙක් ගංජා සමඟ අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කළ බව හා එහි පුද්ගලයන් 04 දෙනෙකු සිටියද ගංජා ළඟ තබාගෙන සිටි අය වන මලිත් මාලක සහ උශේර තරුෂික යන අය පමණක් අත්අඩංගුවට ගත් බවට කරන චෝදනාව හා පහරදීමක් සිදු කළ බවට කරන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවද පවසා ඇත.

වෛද්‍යමය සාක්ෂි :-

වෛද්‍ය බී.වී.රොශාන් එරන්ද, අධිකරණ වෛද්‍ය නිළධාරි, අම්පාර මහ රෝහල විසින් ඉදිරිපත් කර ඇති උශේර තරුෂික යන අයට අදාළ අංක MIEF NO 1032/20 දරණ අධිකරණ වෛද්‍ය වාර්ථාවට අනුව, රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදෙනු ලබන කෙටි රෝග ඉතිහාසයේ "පොලිස් නිලධාරියෙකු පිස්තෝලයක් කටට ඇතුලු කර දණහිසට, පිටට, පපුවට හා කණ්වලට පහරදුන් බව" පවසා ඇත.

වෛද්‍යවරයා විසින් පැමිණිලිකරුගේ මුවෙහි එක් තුවාලයක් හඳුනාගෙන ඇත. එය වෛද්‍යවාර්තාව අනුව 2cm X 2cm abrasion on the left side of the inside the mouth වශයෙන් විස්තර කර ඇත.

පුද්ගල සාක්ෂි :-

01. පැමිණිලිකාරියගේ පුතා සමඟ අදාළ සිදුවීමට මුහුණ දුන් තත්සර දිල්රුක් මානවඩු VH 17/2 . ඉන්ද්‍රාසර පුර, අම්පාර, යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ පුතා වන උශේර තරුෂික යන අයට පොලිස් නිළධාරීන් විසින් කණට පහර දී පිස්තෝලයෙන් කටට ඇන්න බවත්, තමාටද පහර දුන් බවත්, තමාට සහ උශේර තරුෂික යන අයට මාංචු දමා ප්‍රශ්න කළ බවත්, පසුව තමාට යොදන ලද මාංචු ගලවා එය මලිත් මාලකට දමා අශේර තරුෂික සහ මලිත් මාලක වෑන් එකට නංවාගෙන රැගෙන ගිය බවත්ය.

02. අදාළ සිදුවීමට මුහුණදුන් තෙවරප්පෙරුම ආරච්චිගේ මලිත් මාලක වීරවර්ධන ටී.බී./62/ඒ, අහගමවැල්ල, පරගහකැලේ යන අය ද මෙම කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් තමන්ට හා තම මිතුරන් වන

උශේර තරුෂික, තත්සර දිල්රුක් මානවඩු හා දිනේෂ් පසන් යන තිදෙනාට පොලිස් නිලධාරීන් පහර දුන් බවත්, පසුව තත්සර දිල්රුක් මානවඩු යන අයට දමා තිබූ මාංචු ගලවා තමා වෙත දමා තමාත් උශේර තරුෂිකත් අත්අඩංගුවට ගෙන රැගෙන යන ලද බව සඳහන් කර ඇත.

**විමර්ශනයේ දී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු වන ඩී.එම්.උශේර තරුෂික යන අයව 2020.08.14 වන දින පැය 17.00ට පිටුව 189 ඡේද 77 යටතේ බලපත්‍රයක් නොමැතිව කැනබස් සැටයිවා එල් නොහොත් ගංජා මිලි ග්‍රෑම් 896 ක් සන්තකයේ තබා ගැනීම යන වරදට දිසානායක මුදියන්සේලාගේ උෂේර තරුෂික සහ තෙවරප්පෙරුම ආරච්චිගේ මලිත් මාලක අත්අඩංගුවට ගෙන ඇති බවත්, 2020.08.15 වන දින අම්පාර ම/උ බි 9997/20 යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත් අනාවරණය වේ.

පැමිණිලිකාරියගේ පුතාට පොලිස් නිලධාරීන් කණට පහර දී පිස්තෝලයකින් කටට ඇනීම සිදු කළ බව සිදුවීමට මුහුණදුන් තත්සර දිල්රුක් මානවඩු යන අයගේ ප්‍රකාශය අනුව අනාවරණය වේ. MIEF No 1032/20 අධිකරණ වෛද්‍ය වාර්ථාවට අනුව පැමිණිලිකරුගේ මුව තුළ 2cmx2cm ප්‍රමාණයේ සීරීම් තුවාලයක් ඇති බව අනාවරණය වේ. තවද අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබා දී ඇති කෙටි රෝග ඉතිහාසයේද පොලිස් නිලධාරියෙකු විසින් ගිණි අවියක් තම මුව තුළට දැමූ බවට සඳහන් කර ඇත.

එසේම පැමිණිලිකාරියගේ පුතාට විරුද්ධව මෙයට පෙර මත්ද්‍රව්‍ය භාවිතය හා ළඟ තබා ගැනීම පිළිබඳ චෝදනා නොමැති බවද අනාවරණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකාරියගේ පුතා තමන්ව අත්අඩංගුවට ගැනීම නීති විරෝධීව සිදු කළ බව හා අත්අඩංගුවට ගැනීමේදී පහරදීමක් සිදුකළ බව පවසා ඇත. කෙසේ වෙතත් ඔවුන් අත්අඩංගුවට ගැනීමට අදාළව මේ වන විට ගරු අධිකරණයේ නඩු කටයුත්තක් විභාග වන බැවින් අධිකරණයට කරුණු වාර්ථා කර ඒ සඳහා සහන ලබා ගැනීමේ හැකියාව පැමිණිලිකරුට පවතී.

පැමිණිලිකාරියගේ පුතා වන උශේර තරුෂික යන අය අත්අඩංගුවට ගැනීමේදී පහරදීමක් සිදු කළ බව එම අවස්ථාවේ ඔහු සමඟම සිදුවීමට මුහුණ දුන් තත්සර මානවඩු හා තෙවරප්පෙරුම ආරච්චිගේ මලිත් මාලක වීරවර්ධන යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශ ලබා දෙමින් පවසා ඇත.

උශේර තරුෂික හා සාක්ෂිකරුවන් වන මලිත් මාලක හා තත්සර දිල්රුක් මානවඩු යන අය විසින් පොලිස් නිලධාරීන් උශේර තරුෂික යන අයගේ කටට පිස්තෝලය දමා තර්ජනය කළ බවට ප්‍රකාශ කර ඇත. අධිකරණ වෛද්‍ය නිළධාරී වර්තාවේ මුඛයේ ඇතුලත 2cmx2cm ප්‍රමාණයේ තුවාලයක් ඇති බවට කර ඇති දැන්වීම අනුවද උශේර තරුෂික යන අය විසින් කරනු ලබන ප්‍රකාශය තහවුරු වනු ඇත. අගතියට පත් අය තමන් හිංසාවට පත් කළ නිලධාරියා හඳුනා ගැනීමට අපොහොසත් වුවත්, අදාළ අත්අඩංගුවට ගත් කණ්ඩායම බාරව සිටි පො.සැ.මංජුල මහතා ප්‍රකාශ කර ඇත්තේ, තමා සතුව හා පො.සැ. චන්දන මහතා සතුව පමණක්

ගිනි අවි තිබූ බවයි. ඒ අනුව එම නිලධාරීන් දෙදෙනාගෙන් කෙනෙකු පැමිණිලිකරුව හිංසාවට ලක්කර ඇති බව පැහැදිලි වේ. එසේම අනිකුත් නිලධාරීන්ට ද එම තත්ත්වය වැළැක්වීමේ හැකියාව තිබුන ද එය පැහැර හැර ඇති බව ද පැහැදිලි වේ.

මෙම කරුණු අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී හිංසාවට ලක් කිරීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම, පැමිණිලිකාරියගේ පුතා වන ඩී.එම්.උෂේර තරුෂික යන අය සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

මේ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී හිංසාවට ලක් කිරීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට අනාවරණය වී ඇති බැවින්, මෙහි 1 වන වගඋත්තරකාර පො.සැ 9945 මංජුල සහ පො.සැ 63141 වන්දන යන නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කරනු ලැබේ.

2023.10.04 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

02. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අම්පාර.

B/